# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1801/5 - 2013 මාර්තු මස 12 වැනි අඟහරුවාදා 2013.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.21/1978(x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) සම්බන්ධයෙන් වූ වාර්තාවක්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ ලබා ගැනීමෙන් පසුව, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති සහ ඊට අනුරූපව මෙහි උපලේඛනයේ II වැනි තීරයෙහි කෙටි යෙදුම්වලින් දක්වා ඇති උපාධි මගින්, උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) වෙත උපාධි ප්‍රදානය කිරීමේ තත්වය මේ නියමය මගින් ප්‍රදානය කර සිටිමි.

**උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධි පාඨමාලාවන්* | *II වැනි තීරය*<br>*උපාධි පාඨමාලාවන් සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) | BSc AA (Gen.)ICASL |
| ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (විශේෂ) | BSc AA (Spl.)ICASL |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2013 මාර්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.
03-1033


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG001578— 835 (2013/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www. documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*